# සාර්ථකත්වයට පත් වැනිලා ව්‍යවසායකයෙක් පිළිබඳ අධ්‍යයනය



ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

සමෘද්ධි, ගෘහආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌනඋපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

දිස්ත්‍රික්කය - මහනුවර

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - ගඟඉහලකෝරළේ

ග්‍රාමසේවා වසම - වැටකේදෙණිය

දත්ත රැස්කිරිම, විශ්ලේෂණය හා වාර්තාව සකස් කිරීම

තිලක් ගංගොඩ - සංවර්ධන නිලධාරි

පරිගණකගත කිරිම -

තුසර ඇඩ්වර්ටයිසින්, කඩුගන්නාව

ප්‍රකාශනය -

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

නො :- 24/4

කාසල්වීදිය කොළඹ 08

# ස්තුතිය

අධ්‍යනයේ අවශ්‍යතාව පෙන්වා දෙමින් මෙවන් අධ්‍යනයක් සඳහා යොමුකර මා දිරිමත් කළ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂතුමාටත්

සෑම අවස්ථාවකදීම අවශ්‍ය වූ උපදේශකත්වය හා මඟපෙන්වමින් නිබඳ ශක්තියක් වූ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමාටත්

අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාදීම සඳහා සහයෝගය දැක්වූ ගඟඉහළකෝරළේ ප්‍රාදේශිය ලේකම්තුමාටත් සමෘද්ධි අංශයේ මූලස්ථාන කළමනාකාරතුමියටත්

ක්ෂේත්‍රය තුළදී සහායදුන් සමෘද්ධි මහාසංගමයේ කළමනාකාරතුමාටත් ව්‍යාපෘති කළමනාකාරතුමාටත් සහාකාර ව්‍යාපෘති කළමනාකාරතුමාටත් වැටකේදෙණිය සේවා පියසෙහි සේවය නියුතු සියලුම ක්ෂේත්‍ර නිලධාරිතුමියන්ටත්

මෙම අධ්‍යනය සාර්ථක කර ගැනීම සඳහා සෑම අයුරින්ම සහාය ලබාදුන් පිළිමතලාව මධ්‍යස්ථානයේ සියලුම නිලධාරීන්ටත්

නිසි කලට වේලාවට වාර්ථාව පරිගණකගත කරමින් සහයෝගය දැක්වූ තුසර ඇඩ්වර්ටයිසින් ආයතනටත්,

*ප්‍රණාමය පුද කරමි*

තිලක් ගංගොඩ

සංවර්ධන නිලධාරි

# පටුන


**පළමුවන පරිච්ජේදය**

1.1 වැටකෝදෙණිය ගම පිළිබඳ හැදින්වීම
1.2 මූලික තොරතුරු

**දෙවන පරිච්ජේදය**

**2.1** ව්‍යාපෘතිය පිළිබඳව හැදින්වීම

**තුන්වන පරිච්ජේදය**

**3.1** අධ්‍යයන ගැටළුව

**3.2** අධ්‍යයන පසුබිම

**3.3** අධ්‍යනයේ අරමුණු

**3.4** අධ්‍යන ක්‍රමවේදය

**හතරවන පරිච්ජේදය**

**4.1** වැනිලා වගාකරු පිළිබඳ මූලික තොරතුරු

**4.2** වැනිලා ව්‍යාපාරිකයෙකු ලෙස හැදින ගැනීම

**4.3** අදර්ශ පොකුරු නිෂ්පාදන වැඩසටහන තුළ මොහුගේ දායකත්වය

**4.4** සාර්ථකත්වයට බලපෑ හේතු හා ඔහු සතු ගුණාංග

**පස්වන පරිච්ජේදය**

**5.1** නිගමන

**5.2** යෝජනා

## 1.1 වැටකේදෙණිය ගම පිළිබඳ හැඳින්වීම

ගඟඉහලකෝරළයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටි වැටකේදෙණිය ග්‍රාමනිලධාරි වසම වැටකේදෙණිය ගම වැටකේදෙණිය ජනපදය මැදගොඩ වත්ත බොස්වෝඩ් ජනපදය හා කුඩුගල යන ගම්මානවලින් පෝෂිත වූ අතිශයින්ම දුෂ්කර ප්‍රදේශයකි හෙක්ටර්යාර 462.5 ක භූමි භාගයකින් හෙබි මෙම ග්‍රාමනිලධාරි වසම උතුරින් කෑගල්ල දිස්ත්‍රික්කයේ හා සබරගමුව පළාත් මායිම ද නැගෙනහිරින් මල්වත්තගම ග්‍රාමනිලධාරි වසමද දකුණ හා බටහිර දිසාවෙන් උඩුවැල්ල ග්‍රාමනිලධාරි වසමට ද මායිම්ව පිහිටා ඇත.

මෙම වසමේ පවුල් 536 ක ජනහනයක් ජීවත්වේ ජනගහනයෙන් බහුතරය බෞද්ධයෝ වෙති ඔවුන්ගෙන් වැඩි පිරිසක් කෘෂිකාර්මික දිවිපෙවෙතකට හිමිකම් කියයි තේ ප්‍රධාන ආර්ථික බෝගය වේ ගම්මිරිස් වැනිලා පළතුරු සෙසු ආදායම් මාර්ගය සෙසු පිරිස කුලිවැඩවල නිරත වේ වැටකේදෙණිය වසම උඩරට තෙත් කලාපයේ පිහිටා ඇති අතර ගම්පොළ දොළොස්බාගේ ප්‍රධාන මාර්ගයේ කිලෝමීටර් නවයක් ගොස් මැදගොඩ හන්දියෙන් දකුණට හැරි කිලෝ මීටර් එකක් ගිය විට ගල්කඩුල්ල හන්දියෙන් හැරි ගැමුණුපුර ගම්මානය පසුකළ විට වැටකේදෙණිය ග්‍රාමනිලධාරි වසම හමුවේ භූගෝලිය වශයෙන් කඳු බෑවුම ප්‍රදේශ බහුලව දක්නට ලැබේ බොස්වෝඩ් ජනපදය වදවත්ත රහලගල ක්‍රමික බෑවුම් සහිත ගල්තලා මත පිහිටි අතිදුෂ්කර පදේශයක් වේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 18.ත් 40ත් අතර පවති ප්‍රදේශයේ වර්ෂාපතනය අඟල් 100ත් 200ත් වන අතර වසර මුළුල්ලේම ඊශානදිග නිරිත දිග මෝසම් අන්තර්මෝසම් හා සංවහන වැසි මගින් පෝෂණය ලබයි.

## 1.2 වසමේ මුලික තොරතුරු

ජනගහනය පිළිබඳ මුලික තොරතුරු

| මුළු ජනගහනය | ස්ත්‍රී | පුරුෂ | පවුල් ගණන | නිවාස ගණන | ජන ඝනත්වය |
|---|---|---|---|---|---|
| 2359 | 1140 | 1219 | 538 | 383 | 3.5 |

ජාතීන් අනුව ජනගහනය වර්ග කිරීම

| ජාතිය | මුළු ජනගහනය | ජනගහනය | ජනගහනය | පවුල් ගණන |
|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පුරුෂ | |
| සිංහල | 2358 | 1139 | 1218 | 537 |
| දෙමළ | - | - | - | - |
| මුස්ලිම් | 01 | 01 | 01 | 01 |
| බර්ගර් | - | - | - | - |
| වෙනත් | - | - | - | - |
| එකතුව | 2359 | 1140 | 1219 | 538 |

ආගම අනුව ජනගහනය වර්ග කිරිම

| ආගම | මුළු ජනගහනය | ජනගහනය | ජනගහනය | පවුල් ගණන |
|---|---|---|---|---|
| | | ස්ත්‍රී | පුරුෂ | |
| බෞද්ධ | 2357 | 1136 | 1217 | 536 |
| හින්දු | - | - | - | - |
| ඉස්ලාම් | 01 | 01 | 01 | 01 |
| කතෝලික | 01 | 03 | 01 | 01 |
| වෙනත් | - | - | - | - |
| එකතුව | 2359 | 1140 | 1219 | 538 |

වයස් කාණ්ඩ අනුව ජනගහනය ) 2020ස්ත්‍රී පුරුෂ භාවය අනුව)

| මුළු ජනගහනය | අවු -0 4 | අවු -5 18 | අවු -19 30 | අවු -31 45 | අවු -45 60 | අවු -60 70 | අවු 70 වැඩි |
|---|---|---|---|---|---|---|---|
| ගැහැණු | 112 | 420 | 206 | 150 | 102 | 72 | 78 |
| පිරිමි | 176 | 446 | 185 | 152 | 98 | 87 | 75 |
| එකතුව | 288 | 866 | 391 | 302 | 200 | 159 | 153 |

අධ්‍යාපන මට්ටම අනුව ජනගහනය

| අධ්‍යාපන මට්ටම | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
| පශ්චාත් උපාධිධාරීන් | | | |
| උපාධිධාරීන් | 08 | | |
| ඩිප්ලෝමාධාරීන් | | | |
| අ.පො.ස.උසස් පෙළ සමත් | **276** | **210** | **486** |
| අ.පො.ස.සා. පෙළ සමත් | **308** | **121** | **429** |
| අ.පො.ස.සා.පෙළට අඩු සුදුසුකම් සහිත | **272** | **623** | **895** |
| පාසල් නොගිය | **150** | **78** | **228** |
| එකතුව | **1014** | **1032** | **2038** |

රැකියා අනුව වර්ග කිරිම

| අනු අංකය | රැකියාව | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|---|---|
| 1 | රජයේ රැකියා | 36 | 81 | 117 |
| 2 | අර්ධ රාජ්‍ය රැකියා | 10 | 30 | 40 |
| 3 | පෞද්ගලික අශයේ | 40 | 50 | 90 |
| 4 | කෘෂි අංශය | 275 | 80 | 355 |
| 5 | විදේශ රැකියා | 09 | 03 | 12 |
| 6 | ස්වයං රැකියා | 10 | 02 | 12 |
| 7 | කුලී වැඩ | 165 | 110 | 275 |
| 08 | වෙනත් | 20 | 09 | 29 |

නිවාස අයිතිය අනුව වර්ග කිරීම

| | |
|---|---|
| තමන්ට අයිති නිවාස | 530 |
| කුලී හා බදු නිවාස | 02 |
| අනවසර පදිංචි නිවාස | 06 |
| නිවාස නොමැති | 01 |
| එකකුව | 538 |

## දෙවන පරිච්ඡේදය

### 2.1 වැනිලා වගාව පිළිබඳව හැඳින්වීම

#### ඉතිහාසය

ස්වාභාවික වැනිලින් ලබාගැනීමේ ප්‍රභවය වන බැවින් වැනිලා ආර්ථික වශයෙන් වැදගත් බෝගයකි. වැනිලා ඊසානදිග මෙක්සිකෝවට ආවේණික ශාකයක් ලෙස විශ්වාස කෙරේ. වැනිලාවල රහස මුලින්ම දැනගත් ජන කොට්ඨාශය වූයේ මෙක්සිකෝවේ ඉපැරණි ටොටොනාකෝ ඉන්දියානුවන් ය. ඇස්ටෙක්වරුන් විසින් ඔවුන් පරාජයට පත් කළ විට, ඔවුන් සතු වූ අමුතු ආකාරයේ පලතුර වන වැනිලා කරල් අත්හරින ලෙස අණ කර සිටියේය. පසුව ස්පාඤ්ඤ ජාතිකයින් විසින් ඇස්ටෙක්වරු පරාජයට පත් කරන ලද අතර, ස්පාඤ්ඤ ජාතික නිවකයෙකු වූ ස්පැනියාර්ඩ් හර්නාන්ඩෝ කෝර්ටෙස් විසින් කොල්ල අසාමාන්‍ය හා ප්‍රසන්න පානයක් සාදන ලදී. අවුරුදු අසූවක් තිස්සේ මෙම විශේෂ පානය භුක්ති වින්දේ රදළයන් සහ ධනවතුන් පමණි. **1602** දී පළමුවන එලිසබෙත් රැජිනගේ ඖෂධ සකස් කරන්නා වන හියු මෝගන්, වැනිලා රසකාරකයක් ලෙස භාවිතා කළ හැකි බව පවසන ලද අතර, මෙම විදේශීය භෝගයේ වැදගත් බව අවසානයේදී අනාවරණය කර ගන්නා ලදී. කෙසේ වෙතත්, වැනිලා කරල් වලින් වැනිලින් වෙන්කර ගැනීමට ගොබ්ලිට හැකි වූයේ **1858** දී පමණි. අද වැනිලා යනු මැඩගස්කරය, ඉන්දුනීසියාව, මෙක්සිකෝව, ටහීටි සහ තවත් රටවල් කිහිපයක වගා කරන වාණිජ බෝගයකි.

## නිෂ්පාදන සහ ප්‍රයෝජන

වැනිලා වලින් නිස්සාරණය කරන ප්‍රධාන නිෂ්පාදනය වන්නේ වැනිලින් ය. එය රසකැවිලි කර්මාන්තය, සුවඳ විලවුන් හා ඖෂධ කර්මාන්තයේ දී රසකාරකයක් ලෙස භාවිතා කරයි.

## ප්‍රධාන වශයෙන් වගා කරන ප්‍රදේශ

ශ්‍රී ලංකාවේ වැනිලා වගාව ප්‍රධාන වශයෙන් මැද හා පහතරට තෙත් කලාපයේ ගෙවතු වගාවකට සීමා වී ඇත. වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය හෙක්. 100 ට වඩා අඩුය. මහනුවර, නුවරඑළිය, මාතලේ සහ කෑගල්ල දිස්ත්‍රික්ක යන්හි ප්‍රධාන වශයෙන් වගා කෙරේ.

## පාංශු සහ දේශගුණික අවශ්‍යතා

### පස

ඉතා සාරවත් හොඳින් ජලය බැස යන ලෝම පස වඩාත් යෝග්‍ය වේ. පස කාබනික ද්‍රව්‍ය වලින් පොහොසත් විය යුතුය.

### දේශගුණය

උන්නතාංශය – වැනිලා මුහුදු මට්ටමේ සිට මීටර 1000 ට වඩා උස හොඳින් වගා කළ හැකිය. සෙල්සියස් අංශක 21-32 අතර උෂ්ණත්වය ඉතා සුදුසු ය. නමුත් සෙල්සියස් අංශක 27 ක උෂ්ණත්වයේදී වැනිලා හොඳින් වැවේ. වර්ෂාපතනය – මි.මී. 2000-2500 වර්ෂාපතනය සුදුසු ය. නමුත් මල් හට ගැනීම ආරම්භය සඳහා මාස 2-3 ක වියළි කාලයක් අවශ්‍ය වේ.

## බෝගය ස්ථාපනය කිරීම

### රෝපණ ද්‍රව්‍ය

වර්ධක ප්‍රචාරණය භාවිතා කරනු ලැබේ. 3′-4.5′ (මීටර 1-1.5) ප්‍රමාණයේ දඬු කැබලි තෝරාගත් මව් වැල් වලින් ලබා ගනී. දඬු කැබලි වල පහළ කෙළවර පුරුකට ආසන්නයෙන් තිබිය යුතු අතර පහළ කෙළවරින් පත්‍ර 3-4 ඉවත් කළ යුතුය. අංකුර වැඩීම සඳහා දඬු කැබලි සඳහා දින 7 ක් පමණ ආධාරකයක් මත එල්ලා තැබිය යුතුය. පුරුක් 3 – 4 සහිත කැබලි 8 ”X 5” පොලිතින් මලුවල සිටුවිය හැකි අතර රිකිලි දැමූ පසු ඒවා රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිතා කළ හැකිය.

## ක්ෂේත්‍රයේ රෝපණය

වැනිලා සෙවන ප්‍රිය කරන ශාකයකි. එබැවින් ප්‍රමාණවත් සෙවන (50-60%) ලබා දීම සඳහා සජීවී ආධාරක ගස් භාවිතා කරයි. ග්ලිරිසීඩියා යනු වඩාත් සුදුසු සෙවන ගස සහ ආධාරක ගස වන අතර වැනිලා රෝපණය කිරීමට අවම වශයෙන් මාස හයකට පෙර ක්ෂේත්‍රයේ සිටුවනු ලබේ.

පරතරය – මීටර් 2.5 x 1.5 (අඩි 8 x 5) පරතරයට හෙක්ටයාරයට දඬු කැබලි 2000 සිටුවිය හැකිය. වර්ෂාව ආරම්භයත් සමඟ සිටුවීම කළ යුතුය. ආධාරකයේ මුල සිට විෂ්කම්භය අඩි 2 ක් සහ අඟල් 8 ක් පමණ ගැඹුරට පස බුරුල් කර ගත යුතුය. ඉන්පසු කාබනික පොහොර කූඩා 2-3 ප්‍රමාණයක් එක් කළ යුතුය. ආධාරක ගස වටා පැළ සිටුවීමට සකස් කරගත් භූමියෙහි මතුපිට හරහා අඟල් 4 ක් ගැඹුරට කාණුවක් ආකාරයට සාදා ගත යුතුය. වැනිලා දඬු කැබැල්ලේ පහල කෙළවරේ සිට සෙ.මී. 3 ක් පමණ පසෙන් ඉහලට සිටින සේ එම කැබලි තිරස් අතට කාණුව තුල තබා පස්වලින් වසා ගනු ලැබේ. සිටුවා ගත් දඬු කැබලිවල ඉහල කෙළවර ආධාරකයට තබා ගැට ගසා ගත යුතු අතර, සෙන්ටිමීටර 7.5 – 15 පමණ ඝනකමට දිරාපත් වූ කාබනික ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් වසුන් කළ යුතුය.

## බෝග කළමනාකරණය

### වැල් පුහුණුකිරීම

සිටුවා ගත් වැනිලා වැල් කැබලි වර්ධනය වත්ම අළුතින් මතුවන අක්ෂීය අංකුර උඩු අතට වැඩීමට පුහුණු කළ යුතුය. වැල් ආධාරක ගස මුදුනට ළඟා වූ විට ඒවා නැවත පහලට වැටීමට ඉඩ දිය යුතුය. ඒවා නැවත පොළොව මට්ටමට වර්ධනය වූ පසු බිම දිගේ සෙන්ටිමීටර 30-45 (අඩි 1-1.5) බිම දිගේ වර්ධනය වීමට සලස්වා නැවත දල්ල ඉහළට කරකවා ආධාරක ගස මතට වැඩීමට ඉඩ සැලැස්විය යුතුය. එක් වැලිකින් වැල් කිහිපයක් සාදන තුරු මෙම ක්‍රියාවලිය නැවත සිදු කළ යුතුය. වැල්වල පොළොව මට්ටමේ ඇති වැල් කොටස් කාබනික පොහොරවලින් ආවරණය කළ යුතුය.

### අස්වනු නෙලීම

පරාගනයෙන් මාස 8-9 කට පසු කරල් මේරීම සිදු වේ. අස්වනු නෙළීම ප්‍රධාන වශයෙන් නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා සිදු කෙරේ. කොළ පැහැති කරලෙහි කෙළවර කහ පැහැයට හැරෙන විට සහ පහළ කෙළවරේ කරල් විවෘත වන විට අස්වනු නෙලීම සඳහා සුදුසුම කාලයයි. අස්වැන්න නෙළීමේදී පරිණත කරල් පමණක් නෙලිය යුතුය. හොඳින් පැසුණු කරල් 60 ත් 70 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වන අතර සැකසූ කරල් කිලෝග්‍රෑම් 1 ක් සෑදීම සඳහා අමු කරල් කිලෝග්‍රෑම් 6 ක් අවශ්‍ය වේ. කරල් අවම වශයෙන් 6cm විය යුතු අතර වඩා හොඳ තත්ත්වයේ කරල් 10cm ට වඩා වැඩි විය යුතුය. පරාගණයෙන් මාස 2 කට පසු කුඩා කරල් (සෙන්ටිමීටර 10 ට අඩු) පොකුරුවලින් ඉවත් කළ යුතු අතර පොකුරක් තුළ කරල් 8-10 ක ප්‍රමාණයකට පමණක් ඉඩ දී අනෙක් සියලුම කරල් ඉවත් කළ යුතුය. කරල උඩු අතට නැමීමෙන් කඩා ගත යුතු අතර, කැඩුම් මතුපිටෙහි දිලීර හානි වළක්වා ගැනීම සඳහා කතුර හෝ පිහියක් ලෙස භාවිතාකර අස්වැන්න නෙලීම නොකළ යුතුය.

## ඖෂධීය හා රසායනික ගුණාංග

වැනිලා නිස්සාරණයේ බොහෝ සංයෝග තිබුණද වැනිලා වල ලාක්ෂණික රසය හා සුවඳ සඳහා වඩාත්ම ලබාදෙන්නේ වැනිලින්ය. කෙසේ වෙතත්, වැනිලා සාරයේ සුළු සංයෝග ගණනාවක් තිබේ. වැනිලා තෙල්වල ඇති ප්‍රධාන සංයෝගය වන්නේ පයිපර්නෝල්ය.

## 2.2 වැඩ සටහන ක්‍රියාත්මක කළ ආයතන හා නිලධාරීන්

ප්‍රතිපාදන සැපයීම :- සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය

ක්‍රියාත්මක කළ ආයතන :- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය සමෘද්ධි අංශය

නිලධාරීන් :- ව්‍යාපෘති කළමනාකරු ව්‍යාපෘති සහකාර හා සමාද්ධි සංවර්ධන නිලධාරි

අධික්ෂණය හා මෙහෙයවීම :- සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂ -මහනුවර ප්‍රාදේශීය ලේකම් - ගඟඉහළකෝරළය සහකාර ප්‍රාදේශීය ලේකම් - ගඟඉහළකෝරළය සමෘද්ධි සම්බන්ධිකරණ නිලධාරි -මහනුවර

## 2.3 වැඩ සටහන ක්‍රියාත්මක කළ සහාය ආයතන හා නිලධාරින්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ගොවිජන කේන්ද්‍රය

සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ කළමනාකාර අධ්‍යක්ෂක

රාක්ෂාව පුජාමූල බැංකුවේ කළමනාකරු







## තුන්වන පරිච්ඡේදය

**3.1** අධ්‍යයන ගැටළුව

රජයේ විවිධ සුභසාධන වැඩ සටහන් මගින් බහුතරය අඩු සාර්ථකත්වයක් ලබා ගනිද්දි වැටකේදෙණියේ එස්.ජී.ඩග්ලස් මහතා වැනිලා වගාවෙන් සාර්ථක ව්‍යවසායකයෙක් වන්නේ කෙසේ ද ?

**3.2** අධ්‍යයන පසුබිම

දිළිදුකම, වර්තමානයේ නොදියුණු ආර්ථිකයක් සහිත සංවර්ධනය වෙමින් පවත්නා රටවල් තුළ පොදු ගැටලුවකි. මේ නිසාම සංවර්ධනය වෙමින් පවතින රටවල් දුගී බව අවම කිරිම සඳහා සුභසාධන වැඩ සටහන් ක්‍රියාත්මක කරයි. දුගී භාවය සංකීර්ණ ආර්ථික හා සමාජීය ප්‍රපංචයකි. එය බහුමානීය ස්වරූපයක් ගනීයි .

දිළිදුකම අවම කිරීම ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ ප්‍රධාන ඉලක්කයකි. වර්තමාන ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ ද අඩු ආදායම්ලාභින් සවිබල ගැන්වීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය කෙරෙහි අවධානය යොමුව ඇත. 1994 වර්ෂයේ ක්‍රියාවට නැගුණ සමෘද්ධි සංවර්ධන වැඩසටහන ප්‍රජාව සමාජ ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම උදෙසා කටයුතු කර ඇත.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක සමාජ සුභසාධන වැඩ සටහන් අතරින් ප්‍රමුඛ වන සමෘද්ධි වැඩ සටහන තුලින් අතිශයින්ම සාර්ථකත්වයට පත්වූ වැනිලා වගාකරුවෙක් ව්‍යාපාරිකයෙක් බවට පත්වූ සිද්ධියක් ඉදිරිපත් කිරිම මේ නිබන්ධනයෙන් අපේක්ෂිතය.

**3.3**අධ්‍යයනයේ අරමුණු

ප්‍රධාන අරමුණ

වැටකේදෙණිය ග්‍රාමසේවා වසමෙන් බිහිවු වැනිලා වගාකරුවෙක් හා ව්‍යාපාරිකයෙක් වු එස්.ජී.ඩග්ලස් මයාගේ සාර්ථකත්වයට බලපෑ හේතු සොයා බැලිමයි.

අනෙකුත් අරමුණු

1. ඩග්ලස් මහතාගේ ව්‍යාපාරික මාවත පිළිබඳ අවබෝධයක් ලබා ගැනිම
2. සාර්ථකත්වයට බලපෑ පුද්ගල චර්යාවන් පැහැදිලි කර ගැනිම
3. මෙම සාර්ථකත්වය තිරසරව පවත්වා ගැනීමට කළ යුතු දෑ හඳුනා ගැනීම
4. සමෘද්ධි නිෂ්පාදන ගම්මාන වැඩ සටහනේදි මොහුගේ භූමිකාව පැහැදිලිකර ගැනීම

### 3.4 අධ්‍යයන ක්‍රමවේදය

අධ්‍යයන නියදිය තෝරා ගැනීම

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟඉහළ කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැටකේදෙණිය ග්‍රාම නිළධාරි වසම අධ්‍යයන ප්‍රදේශය වේ. මෙම වසම තුළ ක්‍රියාත්මක සමෘද්ධි නිෂ්පාදන පොකුරු ගම්මාන සංවර්ධන වැඩසටහන හා සම්බන්ධ ව්‍යාපාරකයින් අතරින්, සසම්භාවි නියදි ක්‍රමයක් වන අරමුණුගත නියදි ක්‍රමය තුළින් සාර්ථක ව්‍යවසායකයෙකු තෝරා ගැණිනි.

දත්ත එකතු කිරීම

ද්විතීයික දත්ත එකතු කිරීම

මෙම සිද්ධි අධ්‍යයනයට අදාළව මූලික දැනුම ලබා ගනු වස් වැනිලා වගාව පිළිබඳව ලියවී ඇති අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත සඟරා, ලිපි ලේඛණ, සහ අන්තර්ජාලය යන ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කළේය.

ප්‍රාථමික දත්ත එකතු කිරීම

ප්‍රාථමික දත්ත ලබා ගැනීම  සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ සහභාගිත්ව නිරීක්ෂණ ක්‍රමය යන ශිල්පක්‍රම භාවිතා කරන ලදී.

**3.5** අධ්‍යයන සීමා

සාර්ථක එක් වැනිලා වගාකරුවෙක් හා ව්‍යාපාරිකයෙකු පමණක් මෙම අධ්‍යයනට යොදා ගැනිමත් කොවිඩ් වසංගත තත්ත්වයත් අධ්‍යයනයේ සීමාකම් ලෙස සදහන් කළ හැකිය.



**4.1** වැනිලා වගාකරු පිළිබඳ මූලික තොරතුරු

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟඉහල කෝරළේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ වැටකේදෙණිය ග්‍රාමසේවා වසමේ ජීවත්වන ඔහු එස්.ජී.ඩග්ලස් ය. සහෝදර සහෝදරියන් පස්දෙනෙකුගෙන් සමන්විත පවුලක දෙවෙනියාය.නිදහස් අධ්‍යාපනයෙන් උපරිම ප්‍රයෝජන ගත් ඔහු අ.පො.ස.උසස් පෙළ විභාගය සමත්වීම දක්වා ඉගෙනුම ලබයි. අධ්‍යාපනය තුළ දක්ෂ ශිෂ්‍යයෙ ලෙස ගුරුවරුන්ගේ සිත දිනාගෙන කටයුතු කළේය. විවිධ අභියෝග හමුවේ වසර කිපයකම ශිෂ්‍ය නායකයෙකු ලෙස සම්මාන ලැබීමට ද ඔහුට හැකි විය. අද එස්.ජී.ඩග්ලස් මහතා වැටකේදෙණිය ජනපදය වැටකේදෙණිය ලිපිනයෙහි තමාගේම නිවසක ජිවත්වේ. අවුරුදු 40ක් පමණ වන ඔහු දරුවන් දෙදෙනෙකුගේ පියෙකු ලෙස තම බිරිද සමඟ සතුටින් සැහැල්ලු ජීවිතයක් ගත කරයි.

කඩවසම් දක්ෂ තරුණයෙකු වූ මොහු 2009 වර්ෂයේ මාර්තු මස මාතලේ වැනිලා පර්යේෂණ ආයතනයේ වැනිලා වගාව පිළිබඳව සතියක පුහුණුවක් ලබයි.කුරුදුවත්ත ගොවිජන මධ්‍යස්ථානයේ කෘෂිකර්ම නිලධාරිවරයාගේ උපදෙස් හා වසමෙහි කෘෂිකර්ම විෂයභාර නිලධාරිතුමාගේ මඟපෙන්වීම යටතේ වැනිලා වගාව ඔහු සුභමොහොතින් ආරම්භ කරයි. සමෘද්ධි සහනාධාරලාභියෙකු බවට පත්කරමින් ඔහුට රුපියල් 3500.00 ක සමෘද්ධි සහනාධාරයකට හිමිකම් ලැබයි. රාජ්‍ය නොවන සංවිධානාවල හා දේශපාලන අධිකාරියේ ද සහාය ලබාගැනීමට මෙම තරුණ දක්ෂ වැනිලා වගාකරුවා සමත් වේ.වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමියගේ උපදෙස් පරිදි සමෘද්ධි සංවර්ධන බැංකුවෙන් ණයක් ලබාගෙන 2010 වර්ෂයේ වැනිලා වගාව ව්‍යාප්ත කරයි.

වර්ග අඩි **540**ක වැනිලා ගෘහය





ගෘහස්ථ වැනිලා වගාවේ නියැලී සිටින ඩග්ලස් මයා



අතිශයින් සාර්ථක ඵල දැරීමට ආසන්න වැනිලා වගාව

## 4.2 වැනිලා වගාකරු ව්‍යවසායයෙකු වීම හා විකාශනය

වැනිලා වගාවට දැඩි අශාවක් හා ඇල්මක් දැක්වූ මොහු 2011 වර්ෂයේ ගඟඉහළකොරළයේ සමෘද්ධි මහසංගමයේ කළමනාකරු ව්‍යාපෘති උපදෙස් හා මගපෙන්වීම පරිදි වැනිලා සංගමයක් පිහිටුවා ගැනීමට සමත් විය.අභිනව වැනිලා සංගමයේ සභාපතිවරයා ලෙස නිතරගයෙන් පත්වන මොහු කුරුදුවත්ත ගොවිජන කේන්ද්‍රයේ අපනයන කෘෂිකර්ම නිලධාරිවරයා හමුවී වැනිලා වගාව පිළිබඳව උපදෙස් පතයි.මෙහි ප්‍රතිඵලයක් ලෙස වැනිලා සංගමයේ නිලධාරි හා සමාජික පිරිස සමග මූලික සාකච්ඡාවක් වැටකේදෙණිය සේවා පියසේදි පැවැත්විණි.අනතුරුව වැනිලා සංගමයේ සාමාජික සමාජිකාවන් 30ක් වැනිලා වගාව වැටකේදෙණිය වසම තුළ ආරම්භ කළේය.වගාවට අවශ්‍ය වැනිලා දඬු අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලබාදුන් අතර තාක්ෂණික සහාය අපනයන කෘෂිකර්ම නිලධාරිතුමා හා වසමේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරතුමිය විසින් ලබාදෙන ලදි. කාබනික පොහොර වගාකරුවන් විසින් සපයා ගන්නා ලදි.දැඩි කැපවීම හා උනන්දුව මත පියවරෙන් පියවර වැනිලි වගාව සාර්ථක විය.වැනිලා අස්වැන්න අලවි කරගැනිමට වෙළඳ පොළක් නොමැති වීම ගැටලුවක් විය. එයට විසඳුමක් ලෙස සංගමයේ සියලුම සමාජිකයින්ගේ වැනිල අස්වැන්න සධාරණව මිලදී ගෙන කිරිපිටි හා රසකැවිලි සමාගම් වෙත ගොස් අලවි කිරිමට ඔහු කටයුතු කරයි. එස්.ජී.ඩග්ලස් මයාගේ අවංකභාවයත් විනිවිදභාවය හා ප්‍රමිතියෙන් යුතු වැනිලා බැවින් වෙළඳපොළ ඉල්ලුමක් ද නිර්මාණය විය.සැමදෙනාගේම සිත්දිනාගෙන කටයුතු කළ මොහු කිර්තිමත් සුළු පරිමාණ වැනිලා ව්‍යාපාරිකයෙක් බවට පත්වේ.මොහු වැනිලා වගාවට හා ව්‍යාපාරයට දැක්වූ කැපවීම හා උනන්දුවේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය නොවන සංවිධානයක් මගින් විදේශීය වැනිලා වගාව පිළිබඳව පුහුණුවකට විදේශ ගත වේ.විදේශිය ගත පුහුණුවෙන් පසු ලංකාවට පැමිණි මොහු වැනිලා වගාව හා ව්‍යාපාරය ප්‍රචලිත කිරීමට හා පුළුල් කිරීමට කටයුතු කරයි. වසමේ අඩු ආදායම් පවුල් 25ක්ද සමෘද්ධිලාභි පවුල් 25ක් අතර වැනිලා වගාව ප්‍රචලිත කරයි. මේ සඳහා අවශ්‍ය තාක්ෂණය හා වැනිලා දඬු ඩග්ලස් මහතා ලබාදුණි.වැනිලා සංගමයේ ද පූර්ණ සහයෝගය ලබාදීමට ඔහු කටයුතු කළේය. වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමිය ප්‍රමුඛ සේවා පියසේ සේවයේ නියුතු නිලධාරින්

මඩුල්ල ලබාදුන් සහාය ද ඉතා අගනේය.අවශ්‍ය ණය පහසුකම් පවුල් 50 වෙත විධිමත්ව ක්‍රමානුකූලව සමෘද්ධි බැංකු මගින් ලබා ගැනිමට ද හැකිවිය.

එස්.ජී.ඩග්ලස් මයා විදේශතව ලබාගත් පුහුණුවෙන් ලද දැනුම භාවිතා කරමින් අමු වැනිලා කරල් අලවිය වෙනුවට වියලි වැනිලා අලවිය ආරම්භ කරන ලදි.වියලන ලද වැනිලා කරල් අලවිය මගින් විශාල ලාබයක් ලද අතර ඉල්ලුමද වැඩි විය. කිරිපිටි හා රසකැවිලි නිෂ්පාදන සමාගම් ඉතාම තත්වයෙන් උසස් වියලි වැනිලා මහුගේ නිවස වෙත පැමිණිම මිලදි ගැනීමට ද පෙළඹුණි. වැනිලා වියලීමේ ක්‍රියවලිය වේගවත් කිරිම සදහා වැනිලා වියලීමට යන්ත්‍රණයක් මිලදි ගන්නා ලදි. වැනිලා සංගමය මගින් අවට ගම්මානවල ද වැනිලා වගාව ප්‍රචලිත කරන ලදි. නෙස්ලේ සමාගම, මිල්කෝ සමාගම,එලිෆන්ට් හවුස් වැනි ආයතන ද මොහුගෙන් වැනිලා මිලදි ගැනීමට පැමිණියේය. මිල්කෝ සමාගම මගින් වැනිලා පුහුණුවක් සදහා මොහු විදේශ ගත වේ.ලංකාවට පැමිණිමෙන් අනතුරුව ඉතා සාර්ථකව වැනිලා ව්‍යාපාරය පවත්වාගෙන යයි.



## 4.3 ආදර්ශ පොකුරු නිෂ්පාදන වැඩසටහන තුළ මොහුගේ දායකත්වය

එස්.ජී.ඩග්ලස් මහතා **2017** වර්ෂය වන විට ඉතා ජනප්‍රිය වැනිලා වගාකරුවෙක් හා ව්‍යාපාරිකයෙකි.සමෘද්ධි වැඩසටහන තුළින් බිහිවූ ඉතා සාර්ථක පුද්ගලයෙක් ලෙස ප්‍රාදේශිය ලේකම්තුමා හා සමෘද්ධි අංශයේ සැම දෙනා අතර ජනප්‍රිය විය. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ පොකුරු ගම්මානයක් ලෙස වැටකේදෙණිය තෝරා ගැනීමට එක් හේතුවක් වන්නේ මොහුගේ ක්‍රියා කලාපයයි. මෙම ආදර්ශ ගම්මාන වැඩ සටහන තුළ වැනිලා වගාව ප්‍රවර්ධනය සඳහා අඩු ආදායම්ලාභීන් සහ සමෘද්ධි ප්‍රතිලාභීන් **435**කු අතරින් ශක්‍යතා අධ්‍යනයකින් අනතුරුව **129**කු තෝරා ගනිමින් පහත සඳහන් අංශ 03 ඔස්සේ වැඩ සටහන් ක්‍රියාත්මක කෙරුණි.

1. වැනිලා වගාව ප්‍රවර්ධනය කිරිමේ වැඩ සටහන
2. වැනිලා ගෘහ ඉදිකිරිමේ වැඩ සටහන
3. වැනිලා දඬු ලබාදිමේ වැඩ සටහන

මෙම වැඩ සටහන සඳහා සමෘද්ධි දෙපාර්තමේන්තුවේ දායකත්වය රුපියල් මිලියන **2.2**කු පමණ වන අතර ප්‍රතිලාභි දායකත්වය රුපියල් මිලියන **1.6**ක් පමණ වේ.

| අනු අංකය | විස්තරය | ලබාදුන් යෙදවුම් | දෙපාර්තමේන්තුවේ දායකත්වය | ප්‍රතිලාභි දායකත්වය |
|---|---|---|---|---|
| 1 | තොරාගත් නව වැනිලා වගාකරුවන් කු 129 සඳහා | බහුකාර්ය ඉනිමන් 01<br>වැනිලි පිහි 01<br>ප්ලාස්ටික් කූඩා 01 | 1,696,350.00 | 1,161,000.00 |
| 2 | වගාකරමින් සිටි වගාකරුවන් කු සඳහා86 | දිග අඩි වැනිලා 04<br>100 දඬු | 430,000.00 | 292,400.00 |
| 3 | වැනිලා ගෘහ (නියමු ව්‍යාපෘති)02 | වර්ග අඩි 540<br>02 වැනිලා ගෘහ | 100,000.00 | 170,000.00 |
| | සමස්ථ යෙදවුම්වල වටිනාකම | | **2,226,350.00** | **1,623,400.00** |

මෙම වැඩ සටහන ක්‍රියාත්මක වීමෙන් අනතුරුව හා ඔහුගේ දැඩි කැපවීම මත වැනිලා නිෂ්පාදනය කිලොග්රෑම් 5160 සිට කිලොග්රෑම් 8250 දක්වා වැඩි විය.අමු වැනිලා කරල් කිලෝග්රෑම්01ක මිල රුපියල් 2500.00සිට රුපියල් 6000.00 දක්වා වැඩි විය.වැටකේදෙණිය වසමේ වාර්ෂික වැනිලා නිෂ්පාදනය හා ආදායම පහත වගුවේ දැක්වේ.

| අනු අංකය | වර්ෂය | වාර්ෂික නිෂ්පාදනය | **1kg** මිල රු. | වාර්ෂික ආදායම |
|---|---|---|---|---|
| 1 | 2017 | 5160kg | 2500.00 | 12 ,900,000.00 |
| 2 | 2018 | 7500kg | 6000.00 | 4’50’00’000.00 |
| 3 | 2019 | 7900Kg | 6000.00 | 3’60’00’000.00 |
| 4 | 2020 | 8250kg | 6000.00 | 1’50’00’000.00 |

මෙම නිෂ්පාදනය මිලදී ගෙන ඔහුගේම වැනිලා වියලිමේ යන්ත්‍රය මගින් වියලා වියලි වැනිලා කිලෝග්රෑම් 01ක් රුපියල් 45,000.00 ත් රු.55,000.00අතර මිලකට දේශීය සමාගම් වෙත අලෙවි කරයි.මොහු අනාගතයේ වැනිලා අපනයන කරුවකු ලෙස කටයුතු කිරීමට අපෙක්ෂාවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සැලසුම් කරමින් සිටියි.

4.4. සාර්ථකත්වයට බලපෑ හේතු හා ඔහු සතු ගුණාංග

- ❖ වැනිලා වගාව පිළිබඳව දෙස් විදෙස්වලින් ලද පුහුණුව
- ❖ වැනිලා වගාවට ආදරය කිරීම හා ඒ පිළිබඳ දැනුම යාවත්කාලීන කරගැනීම
- ❖ පියවරෙන් පියවර ඉදිරියට ගමන් කිරිම
- ❖ පැවති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම
- ❖ ආදායම් වියදම් කළමනාකරණය
- ❖ දෛනික කටයුතු කාලසටහන අනුවකිරිම
- ❖ වැනිලා සංගමයේ කටයුතු විනිවිදභාවෙන් හා මනා කැපවිමෙන් ඉටු කිරිම
- ❖ සති මාසික හා වාර්ෂික ප්‍රගති සමාලෝචන නිසි ලෙස ඉටු කිරිම
- ❖ මානව සම්පත නිසිලෙස හැසිරවීම හා වැඩ ගැනිමේ කලාව ප්‍රගුණ කොට තිබීම
- ❖ රජයේ නිලධාරින් වෙත දැක්වූ මානව දයාව හා හොඳ හිත
- ❖ පෞද්ගලික ජීවිතය ඉතා සතුටින් හා සැහැල්ලුවෙන් ගත කිරිම
- ❖ ආගමික සමාජීය හා සංස්කෘතික කටයුතුවලදී දැක්වූ කැපවිම හා සුහදශිලිභාවය

## පස්වන පරිච්ඡේදය

### නිගමන හා යෝජනා

### 5.1 නිගමන

- ❖ වැනිලා වගාකරුවෙක් ව්‍යාපාරිකයෙක් ලෙස ශක්තිමත් පදනම ලබා ගැනිමට හැකි වූයේ මොහුට දේශීය හා විදේශීය ලද පුහුණු ඉතා මැනවින් ප්‍රගුණ කළ නිසා බව නිගමනය කළ හැකිය.
- ❖ වැනිලා ප්‍රවර්ධනය සදහා කළ වැඩසටහන් ව්‍යාපෘති උපව්‍යාපෘති හා ක්‍රියාකාරකම් අතිසාර්ථක වූයේ සැලසුම් සහාගතව ක්‍රියාත්මක කිරිම මනා මෙහෙයවිම පසුවිපරම් කටයුතු යනාදිය කැපවීමෙන් කළ නිසා බව හදුනා ගත හැකිය.
- ❖ කාබනික පෙහොර පමණක් භාවිතා කරමින් පරිසර හිතකාමි හරිත වගාවක් ලෙස වැනිලා වගාව කළ හැකි වීම.
- ❖ ආදායම් වියදම් කළමනාකරණය ඔහුගේ ව්‍යාපාරය සාර්ථකවිමට බලපෑ ප්‍රබලතම සාධකය බව නිගමනය කළ හැකිය.
- ❖ 2017 වර්ෂයේ ක්‍රියාත්මක වු සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ පොකුරු ගම්මාන වැඩ සටහන ක්‍රියාත්මකවීමෙන් පසු කාලය වැනිලා ව්‍යාපාරයේ ස්වර්ණමය යුගය ලෙස හදුනාගත හැකිය.
- ❖ සමෘද්ධි වැඩසටහන හා වසම තුළ එය ක්‍රියාත්මක කළ නිලධාරින් දුන් සහාය මානව දායාව කැපවීම සුහදශිලි බව වැනිලා ව්‍යාපාරයේ සාර්ථකත්වයේ මාවත විවර කිරීමට හේතුවූ බව නිගමනය කළ හැකිය.

## 5.2 යෝජනා

- ❖ ව්‍යාපාරික ගමන්මඟ තවදුරටත් සාර්ථක කරලීම උදෙසා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දැනුම ලබාදීම.
- ❖ අන්තර්ජාල අලෙවිකරණය වැනි නව අලෙවි ක්‍රමෝපායන් හඳුන්වා දීම.
- ❖ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදුකරමින් අවශ්‍ය තාක්ෂණික සහාය නිරතුරුව ලබාදීමට කටයුතු කිරීම.
- ❖ වැනිලා අපනයනය කෙරෙහි මීට වඩා වැඩි අවධානයක් යොමු කරමින් විදේශීය ඉපයුම් පුළුල් කිරිමට කටයුතු කිරිම.
- ❖ වැනිලා වගාකරුවන් දිරිමත් කිරිම සඳහා වැඩසටහන් සම්පාදනය කිරීම හා සැලසුම් සහගත ලෙස ක්‍රියාත්මක කිරිමට කටයුතු කිරිම.

